# (එ) කාර්මික වර්ධනය*

## (අ) පොදු ලක්ෂණ

නිෂ්පාදන සමාගම් සම්බන්ධයෙන්, මහ බැංකුව විසින් කැරුන සමීක්ෂණය කට අනුව, නිෂ්පාදනයේ වටිනාකම 1963 දීට වඩා 1964 දී සැලකිය යුතු අන්දමින් වැඩිවී ඇති බව පෙනේ. මුළු කාර්මික නිපැයුම් වටිනාකමෙහි වැඩිවීම 1963 දී රුපියල් කෝටි 4·44 ක් වූ අතර, 1964 දී එය රුපියල් කෝටි 10·58 ක් විය. මෙම වැඩිවීමෙන් මුළුමනින්ම මූර්ත නිමැවුමෙහි වැඩිවීමක් පිළිබිඹු නොවේ. ආනයන කැරෙන අමුද්‍රව්‍ය හා අනෙකුත් දෑ හිඟවීම නිසා විශේෂයෙන්ම අවුරුද්දේ අවසාන හරියේදී, ඇතැම් කර්මාන්තවල ක්‍රියාකාරිත්වය අඩුවිය. සමහර කර්මාන්ත වල නිෂ්පාදන ශක්තියෙන් වැඩට නොයෙදෙන .ප්‍රමාණය වැඩිවිය.

මුළු වටිනාකමෙහි දක්නට ලැබෙන වැඩිවීමට හේතුවන ප්‍රධාන සාධක දෙකක් වෙයි. එහෙත් එහි බලපෑම කොතෙක්දැයි, ඇස්තමේන්තු කළ හැක්කේ නොවේ. මින් එකක්.වූයේ වර්ෂය තුළ මිල වැඩිවී යාමය. මෙය වටිනාකම් වැඩිවීමට හේතු විය. අනෙක, කලින් ගෘහකර්මාන්ත වශයෙන් කරගෙන ගිය කුඩා ව්‍යවසායයන් (විශේෂයෙන්ම, ඇඳුම් නිෂ්පාදන කර්මාන්තයේ) බෙහොමයක්ම ව්‍යාපාරික සමාගම් ලෙස ලියාපදිංචි කිරීමය. 1964 දී මහ බැංකු විග්‍රහයට ගැනුන මුළු නිෂ්පාදන කර්මාන්ත සංඛ්‍යාව 717 ක් විය. පසුගිය වසරේ ගැනුන ප්‍රමාණය 433 ක් විය. මෙසේ ගැනුන අළුත් කර්මාන්ත වලින් භාගයක් ප මණ ඇඳුම් හා ලෝහ නිෂ්පාදිත කර්මාන්ත විය. 1964 අපගේ සංඛ්‍යා සටහන්වලට මෙම සමාගම් ඇතුලත් කිරීමෙන් සංඛ්‍යාමය වශයෙන් වටිනාකම වැඩිවීමක් සටහන් වියහැකි අතර, මූර්ත නිෂ්පාදන පරිමාව, තරමක් වැඩියෙන් සටහන් විය හැකිය.

සංඛ්‍යා තොරතුරු වලින් දැක්වෙන පරිදි මේ වර්ෂයේ, කාර්මික .නිෂ්පාදන වටිනාකමේ වැඩිවීම් අනුපාතිකය සියයට 24·5 ක් වෙයි. 1963 වර්ධන අනුපාතිකය සියයට 11·4 ක් විය. මුළු කාර්මික නිපැයුම් වටිනාකම කෙරෙහි, බර තැබීමක් ඇති, එසේම මූලික නිෂ්පාදිත සැකසීමෙන් ලැබෙන පොල් තෙල් කපාපු පොල් සහ පොල්පුනක්කු වැනි නිෂ්පාදිත ඉවත්කොට, අලුත් කාර්මික කටයුතු කෙරෙහි අවධානය යොමු කරන විට 1963 හා 1964 රේ වර්ධන අනුපාතිකය පසුගිය වසර වලට වඩා පිළිවෙලින් සියයට 18·4 හා සියයට 31·4 ක් වෙයි.

1964 නිෂ්පාදන වටිනාකම වැඩිවීමත් සමග කර්මාන්තවල රැකියාවන්ද වැඩි විය. එහෙත් වාර්ෂික සංඛ්‍යා තොරතුරු ගැලපීමේදී මුහුණ පෑ යුතු ගැටලු නිසා, මෙහි නියම* වැඩිවීම දැක්විය හැකි නොවේ. ඇඳුම් නිෂ්පාදන කර්මාන්තයෙහි වැඩිවූ රැකියා, නිෂ්පාදන වටිනාකම වැඩිකිරීම සඳහා සැළකිය යුතු ලෙස බලපා නොමැති වුවද, වැඩිමනත් ප්‍රාග්ධනයක් යෙදවූ නිෂ්පාදනය සඳහා වැඩි වටිනාකමැති උපකරණ යෙදවූ ලෝහ කර්මාන්තයේ නිපැයුම් වටිනාකමේ හැටියට, අතිරේකව ඇතිවූ රැකියා ප්‍රමාණය අඩුය. 1964 වසරේදී ඇඳුම් නිෂ්පාදන කර්මාන්තයෙහි සාමාන්‍ය සේවක සංඛ්‍යාව වැඩිවූවද සේවකයෙකුට වැටෙන වැඩ

---

* බැංකුව විසින් කැරුන සමීක්ෂණයක් පදනම් කරගෙන මෙහි දක්වෙන කාර්මික නිපැයුමේ වටිනාකම පිළිබඳ සංඛ්‍යා සකසා ඇත. මේ සඳහා 1963 දී වාර්තා සැපයූ කර්මාන්තායතන සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් 1964 දී වාර්තා සපයා ඇත. මේ නිසා, 1964 වර්ෂය සඳහා දක්වා ඇති කාර්මික නිෂ්පාදනයෙහි සහ සේවා නියුක්තියෙහි වාර්ෂික වටිනාකමේ වැඩිවීම එම වර්ෂයේ ඇති වූ නියම වැඩිවීමක් ලෙස සැලකිය යුතු නොවේ. මෙම කොටසෙහි දක්වෙන වාර්ෂික වැඩිවීමේ අනුපාතිකය ජාතික නිෂ්පාදිතය හා වියදම් කොටසෙහි දක්වෙන අනුපාතිකය හා සැසඳිය හැකි නොවේ කර්මාන්තවල වැඩිවූ වටිනාකම් (නිපැයුමේ දළ වටිනාකමේ වෙනස මෙන් නොව) දක්වෙන පසුව කී කොටස සකසා ඇත්තේ 1964 මහ බැංකුවේ කාර්මික සමීක්ෂණයට අඩංගු වූ වැඩිවීම් සඳහා ගැලපිලි ඇතිකිරීමෙන් පසුවය.

සංඛ්‍යා සටහන II (එ) අ 1

## 1960–64 කාර්මික නිෂ්පාදිත හා රැකිරක්‍ෂා සංඛ්‍යා සංපිණ්ඩනය

| | සමාගම් ගණන | | | | | සේවකයන්ගේ ගණන | | | | | මුළු මිනිස් දවස් ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1960 | 1961 | 1962 | 1963 | 1964 |
| I. විවිධ ආහාර නිෂ්පාදන | 47 | 52 | 57 | 60 | 62 | 2472 | 2624 | 3151 | 3433 | 3520 | 606 | 664 | 797 | 871 | 901 |
| II. කල්තබාගත් හා ටින්වල අහුරන ලද පළතුරු හා එළවළු .. | 8 | 9 | 14 | 16 | 32 | 120 | 149 | 208 | 238 | 358 | 34 | 42 | 58 | 67 | 97 |
| III විස්කෝතු හා රසකැවිලි | 22 | 39 | 49 | 62 | 82 | 907 | 1302 | 1699 | 2065 | 2590 | 280 | 395 | 487 | 591 | 693 |
| IV. සිසිල් බීම .. | 17 | 23 | 24 | 25 | 33 | 860 | 939 | 949 | 988 | 1089 | 252 | 273 | 275 | 284 | 316 |
| V. කිරි සහ ස්ටවුට් .. | 1 | 1 | 1 | 1 | 1 | 187 | 198 | 309 | 303 | 300 | 58 | 61 | 67 | 68 | 84 |
| VI. දුම්කොළ .. | 23 | 23 | 23 | 23 | 23 | 3574 | 3664 | 3955 | 3960 | 4214 | 975 | 1023 | 1104 | 1104 | 1175 |
| VII. ඇඳුම් .. | 22 | 24 | 32 | 34 | 103 | 2606 | 2787 | 3947 | 4500 | 6955 | 768 | 816 | 1102 | 1261 | 1749 |
| V.II. පාවහන් හා හම් නිෂ්පාදිත .. | 9 | 9 | 10 | 11 | 36 | 1383 | 1289 | 1421 | 1616 | 1990 | 365 | 348 | 373 | 419 | 538 |
| IX. විවිධ රසායනික නිෂ්පාදිත .. | 30 | 37 | 56 | 70 | 96 | 1569 | 1740 | 2070 | 2495 | 3306 | 426 | 492 | 609 | 673 | 884 |
| X. කඩදාසි හා කඩදාසි බෝඩ් භාණ්ඩ .. | 19 | 21 | 28 | 33 | 57 | 804 | 892 | 1139 | 1316 | 2187 | 198 | 226 | 300 | 374 | 638 |
| XI. ලෝහ නිෂ්පාදිත | 20 | 23 | 26 | 28 | 92 | 496 | 593 | 770 | 876 | 2629 | 137 | 166 | 217 | 240 | 743 |
| XII. සකස්කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන්) | 23 | 30 | 41 | 44 | 69 | 323 | 499 | 616 | 671 | 1058 | 87 | 137 | 167 | 191 | 279 |
| XIII. පිහන් බඩු .. | 1 | 1 | 1 | 1 | 1 | 178 | 193 | 240 | 261 | 300 | 53 | 57 | 66 | 81 | 86 |
| XIV. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) | 15 | 18 | 20 | 20 | 24 | 833 | 964 | 1022 | 1177 | 1304 | 232 | 264 | 293 | 377 | 361 |
| XV. තුනී ලෑලි .. | 1 | 1 | 1 | 1 | 1 | 370 | 490 | 554 | 579 | 611 | 123 | 153 | 177 | 185 | 171 |
| XVI. බණිජ වැලි .. | 1 | 1 | 1 | 1 | 1 | 47 | 91 | 102 | 83 | 105 | 13 | 25 | 33 | 23 | 33 |
| XVII. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය .. .. | 1 | 1 | 1 | 1 | 1 | 168 | 164 | 197 | 199 | 200 | 50 | 49 | 59 | 62 | 62 |
| XVIII. සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදිත .. | 2 | 2 | 2 | 2 | 3 | 1542 | 1410 | 1512 | 1541 | 1507 | 457 | 414 | 442 | 440 | 470 |
| එකතුව | 262 | 315 | 387 | 433 | 717 | 18,439 | 19,988 | 23,861 | 26,304 | 34,222 | 5114 | 5605 | 6620 | 7301 | 9280 |

| | වැටුප් ලැයිස්තුව (රු. දශ ලක්ෂ) | | | | | නිෂ්පාදන වටිනාකම (රු. දශ ලක්ෂ) | | | | | මිනිස් දවසක වැටුප (රුපියල්) | | | | | සේවකයෙකුට මිනිස් දවස් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1960 | 1961 | 1962 | 1963 | 1964 |
| I. විවිධ ආහාර නිෂ්පාදන | 4·5 | 4·7 | 5·4 | 5·8 | 6·0 | 44·0 | 146·9 | 147·8 | 147·6 | 160·7 | 7·40 | 7·08 | 6·77 | 6·62 | 6·65 | 245 | 253 | 253 | 254 | 256 |
| II. කල්තබාගත් හා ටින්වල අහුරන ලද පළතුරු හා එළවළු .. | 0·1 | 0·2 | 0·2 | 0·3 | 0·4 | 1·3 | 1·6 | 2·3 | 3·4 | 4·5 | 3·94 | 3·95 | 4·16 | 4·30 | 4·63 | 283 | 282 | 279 | 282 | 271 |
| III විස්කෝතු හා රසකැවිලි | 1·0 | 1·3 | 1·6 | 2·3 | 2·6 | 11·5 | 18·2 | 21·9 | 28·8 | 30·9 | 3·63 | 3·36 | 3·36 | 3·94 | 3·78 | 309 | 303 | 287 | 286 | 268 |
| IV. සිසිල් බීම .. | 2·0 | 2·1 | 2·1 | 2·1 | 2·5 | 8·3 | 7·8 | 10·0 | 11·4 | 13·4 | 7·94 | 7·62 | 7·56 | 7·54 | 8·00 | 293 | 291 | 290 | 287 | 294 |
| V. කිරි සහ ස්ටවුට් .. | 0·3 | 0·3 | 0·4 | 0·4 | 0·5 | 3·1 | 2·4 | 2·2 | 2·4 | 2·7 | 5·27 | 5·34 | 5·19 | 5·45 | 5·50 | 308 | 308 | 309 | 303 | 280 |
| VI. දුම්කොළ .. | 8·2 | 8·3 | 9·2 | 9·6 | 10·1 | 30·0 | 29·0 | 35·0 | 39·0 | 46·2 | 8·41 | 8·12 | 8·37 | 8·66 | 8·64 | 273 | 279 | 279 | 279 | 279 |
| VII. ඇඳුම් .. | 2·6 | 2·9 | 3·9 | 4·3 | 6·9 | 19·4 | 19·8 | 29·3 | 38·4 | 54·9 | 3·40 | 3·56 | 3·56 | 3·43 | 3·93 | 295 | 293 | 279 | 280 | 251 |
| V.II. පාවහන් හා හම් නිෂ්පාදිත .. | 2·2 | 2·4 | 3·0 | 3·3 | 4·5 | 8·3 | 8·5 | 19·6 | 22·3 | 23·4 | 6·09 | 6·80 | 7·96 | 7·86 | 8·30 | 264 | 270 | 262 | 259 | 270 |
| IX. විවිධ රසායනික නිෂ්පාදිත .. | 2·2 | 3·2 | 3·8 | 4·6 | 6·4 | 36·4 | 40·3 | 51·5 | 56·0 | 73·7 | 5·68 | 7·25 | 6·33 | 6·98 | 7·21 | 267 | 282 | 295 | 270 | 267 |
| X. කඩදාසි හා කඩදාසි බෝඩ් භාණ්ඩ .. | 1·7 | 2·0 | 2·5 | 2·9 | 3·8 | 12·5 | 13·9 | 15·4 | 18·3 | 30·1 | 8·65 | 8·77 | 8·29 | 7·70 | 5·93 | 246 | 253 | 263 | 284 | 292 |
| XI. ලෝහ නිෂ්පාදිත | 0·7 | 0·9 | 1·3 | 1·2 | 4·1 | 7·4 | 9·1 | 11·2 | 15·1 | 38·5 | 4·56 | 4·98 | 5·11 | 5·17 | 5·52 | 260 | 279 | 272 | 270 | 283 |
| XII. සකස්කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන්) | 0·3 | 0·5 | 0·6 | 0·8 | 1·2 | 1·5 | 3·7 | 4·3 | 5·8 | 11·0 | 3·23 | 3·56 | 3·75 | 4·11 | 4·31 | 270 | 275 | 271 | 285 | 264 |
| XIII. පිහන් බඩු .. | 0·4 | 0·4 | 0·5 | 0·6 | 0·8 | 1·0 | 1·1 | 1·9 | 2·5 | 2·4 | 7·29 | 7·46 | 7·95 | 7·79 | 8·68 | 297 | 294 | 276 | 259 | 288 |
| XIV. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) | 1·3 | 1·5 | 1·7 | 2·3 | 1·9 | 6·8 | 8·3 | 10·9 | 13·7 | 17·0 | 5·43 | 5·63 | 5·81 | 6·10 | 5·21 | 279 | 279 | 287 | 320 | 277 |
| XV. තුනී ලෑලි .. | 0·8 | 0·9 | 1·4 | 1·4 | 1·3 | 2·3 | 2·9 | 3·4 | 3·9 | 3·9 | 6·50 | 6·10 | 7·65 | 7·65 | 7·70 | 332 | 313 | 320 | 320 | 280 |
| XVI. බණිජ වැලි .. | 0·2 | 0·2 | 0·3 | 0·2 | 0·3 | — | 0·1 | 0·1 | 0·1 | 0·9 | 12·02 | 8·49 | 7·95 | 6·81 | 7·52 | 287 | 276 | 324 | 282 | 312 |
| XVII. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය .. .. | 0·4 | 0·4 | 0·5 | 0·5 | 0·6 | — | 0·2 | 1·1 | 1·2 | 1·0 | 7·40 | 7·82 | 7·60 | 7·61 | 8·06 | 297 | 297 | 301 | 311 | 310 |
| XVIII. සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදිත .. | 3·5 | 3·1 | 3·4 | 3·4 | 3·5 | 19·6 | 17·9 | 20·2 | 22·5 | 23·0 | 7·80 | 7·80 | 7·80 | 7·79 | 7·33 | 312 | 312 | 312 | 312 | 312 |
| එකතුව | 32·4 | 35·3 | 41·8 | 46·0 | 57·4 | 313·4 | 331·7 | 388·0 | 432·4 | 538·2 | 6·22 | 6·19 | 6·31 | 6·30 | 6·19 | 277 | 280 | 277 | 278 | 271 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුව

සංඛ්‍යා සටහන II (එ) අ. 2

**1960/64 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම - කර්මාන්ත හා ප්‍රධාන නිෂ්පාදිත අනුව වර්ග කොට**

| | වටිනාකම (රු. දශ ලක්ෂ) | | | | | කර්මාන්තයෙහි සියයට ගණන | | | | | මුළු කාර්මික නිෂ්පාදිතයේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1960 | 1961 | 1962 | 1963 | 1964 |
| **I. විවිධ ආහාර නිෂ්පාදිත** | **144.0** | **146.9** | **147.8** | **147.6** | **160.7** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **46.5** | **44.3** | **38.1** | **34.2** | **29.9** |
| කිරි ආහාර | 1.9 | 3.5 | 3.0 | 4.1 | 4.9 | 1.3 | 2.4 | 2.0 | 2.8 | 3.0 | 0.6 | 1.1 | 0.8 | 0.9 | 0.9 |
| ගව හා කුකුල් ආහාර .. | 17.1 | 17.3 | 18.4 | 19.6 | 23.5 | 11.9 | 11.8 | 12.4 | 13.3 | 14.6 | 5.5 | 5.2 | 4.7 | 4.5 | 4.4 |
| කපාපු පොල් .. .. | 13.4 | 8.8 | 11.4 | 11.0 | 13.2 | 9.3 | 6.0 | 7.7 | 7.5 | 8.2 | 4.3 | 2.7 | 2.9 | 2.5 | 2.5 |
| ආහාරයට ගන්නා තෙල් හා මේද | 104.8 | 111.7 | 110.7 | 109.0 | 114.4 | 72.8 | 76.0 | 74.9 | 73.8 | 71.2 | 33.4 | 33.7 | 28.5 | 25.2 | 21.3 |
| ලුණු .. .. .. | 4.2 | 2.7 | 0.7 | 0.4 | 0.5 | 2.9 | 1.8 | 0.5 | 0.3 | 0.3 | 1.3 | 0.8 | 0.2 | 0.1 | 0.1 |
| අයිස් .. .. .. | 1.3 | 1.2 | 1.4 | 1.1 | 1.3 | 0.9 | 0.8 | 0.9 | 0.7 | 0.8 | 0.4 | 0.4 | 0.4 | 0.3 | 0.2 |
| අනෙකුත් .. .. .. | 1.3 | 1.7 | 2.2 | 2.4 | 2.9 | 0.9 | 1.2 | 1.5 | 1.6 | 1.8 | 0.4 | 0.5 | 0.6 | 0.6 | 0.5 |
| **II. කල්තබා ගන්නා ලද හා ටින්වල අහුරන ලද පලතුරු හා එළවළු ..** | **1.3** | **1.6** | **2.3** | **3.4** | **4.5** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **0.4** | **0.5** | **0.6** | **0.8** | **0.8** |
| ජෑම් පෙලි, සෝසස් යනාදිය .. | 0.4 | 0.5 | 0.9 | 2.2 | 3.0 | 30.8 | 31.3 | 39.1 | 64.7 | 66.7 | 0.1 | 0.2 | 0.2 | 0.5 | 0.5 |
| අනෙකුත් .. .. .. | 0.9 | 1.1 | 1.3 | 1.2 | 1.5 | 69.1 | 69.7 | 61.8 | 35.2 | 33.3 | 0.3 | 0.3 | 0.3 | 0.3 | 0.3 |
| **III. බිස්කෝතු රසකැවිලි ..** | **11.5** | **18.2** | **21.9** | **28.8** | **30.9** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **3.7** | **5.5** | **5.6** | **6.7** | **5.7** |
| බිස්කෝතු .. .. .. | 6.2 | 10.5 | 12.7 | 15.7 | 16.4 | 53.9 | 57.7 | 58.0 | 54.5 | 53.1 | 2.0 | 3.2 | 3.3 | 3.6 | 3.0 |
| සීනිබෝල .. .. | 3.9 | 3.4 | 5.1 | 6.6 | 5.5 | 33.9 | 18.7 | 23.3 | 22.9 | 17.8 | 1.2 | 1.0 | 1.3 | 1.5 | 1.0 |
| චොකලට් සහ ටොෆි .. .. | -- | 0.7 | 1.3 | 3.1 | 5.5 | -- | 3.8 | 5.9 | 10.8 | 17.8 | -- | 0.2 | 0.3 | 0.7 | 1.0 |
| අනෙකුත් .. .. .. | 1.5 | 3.5 | 2.8 | 3.4 | 3.5 | 13.0 | 19.2 | 12.8 | 11.8 | 11.3 | 0.5 | 1.1 | 0.7 | 0.8 | 0.7 |
| **IV. සිසිල් බීම .. ..** | **8.3** | **7.8** | **10.0** | **11.4** | **13.4** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **2.6** | **2.4** | **2.6** | **2.6** | **2.5** |
| **V. බීර හා ස්ටවුට් .. ..** | **3.1** | **2.4** | **2.2** | **2.4** | **2.7** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **1.0** | **0.7** | **0.6** | **0.6** | **0.5** |
| **VI. දුම්කොළ .. ..** | **30.0** | **29.0** | **35.0** | **39.0** | **46.2** | **100.0** | **100.0** | **10.00** | **100.0** | **100.0** | **9.6** | **8.7** | **9.0** | **9.0** | **8.6** |
| **VII. ඇඳුම් .. .. ..** | **19.4** | **19.8** | **29.3** | **38.4** | **54.9** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **6.2** | **6.0** | **7.6** | **8.9** | **10.2** |
| කමිස .. .. .. | 7.1 | 7.3 | 14.2 | 20.7 | 25.4 | 36.6 | 36.9 | 48.5 | 53.9 | 46.3 | 2.3 | 2.2 | 3.7 | 4.8 | 4.7 |
| අනෙකුත් (ප්‍රධාන වශයෙන් බැනියන්) .. .. .. | 12.3 | 12.5 | 15.1 | 17.7 | 29.5 | 63.4 | 63.1 | 51.5 | 46.3 | 53.7 | 3.9 | 3.8 | 3.9 | 4.1 | 5.5 |
| **VIII. පාවහන් හා හම් නිෂ්පාදිත** | **8.3** | **8.5** | **19.6** | **22.3** | **23.4** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **2.6** | **2.6** | **5.1** | **5.2** | **4.3** |
| **IX. විවිධ රසායනික නිෂ්පාදිත** | **36.4** | **40.3** | **51.5** | **56.0** | **73.7** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **11.6** | **12.1** | **13.3** | **13.0** | **13.7** |
| ඖෂධ (ග්ලිසරින් ඇතුළුව) .. | 2.2 | 2.5 | 1.9 | 4.2 | 5.7 | 6.0 | 6.2 | 3.7 | 7.5 | 7.1 | 0.7 | 0.8 | 0.5 | 1.0 | 1.0 |
| විලේපන .. .. .. | 1.6 | 1.7 | 3.5 | 5.6 | 6.2 | 4.4 | 4.2 | 6.8 | 10.0 | 8.4 | 0.5 | 0.5 | 0.9 | 1.3 | 1.2 |
| සබන් හා පවිත්‍ර කිරීමේ සංයෝග | 26.9 | 28.1 | 35.1 | 34.0 | 39.0 | 73.9 | 69.7 | 68.2 | 60.7 | 52.9 | 8.6 | 8.5 | 9.0 | 7.9 | 7.2 |
| ගිනිපෙට්ටි .. .. .. | 3.0 | 3.8 | 5.6 | 4.5 | 10.3 | 8.2 | 9.4 | 10.9 | 8.0 | 14.0 | 1.0 | 1.1 | 1.4 | 1.0 | 1.9 |
| දන්තාලේප .. .. | 1.1 | 2.2 | 2.2 | 2.9 | 3.3 | 3.0 | 5.5 | 4.3 | 5.2 | 4.5 | 0.4 | 0.7 | 0.6 | 0.7 | 0.6 |
| අනෙකුත් .. .. .. | 1.7 | 2.0 | 3.2 | 4.8 | 9.7 | 4.7 | 5.0 | 6.2 | 8.6 | 13.2 | 0.5 | 0.6 | 0.8 | 1.1 | 1.8 |
| **X. කඩදාසි හා කඩදාසි බෝඩ් භාණ්ඩ .. ..** | **12.5** | **13.9** | **15.4** | **18.2** | **30.1** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **3.8** | **4.2** | **4.0** | **4.2** | **5.6** |
| ලියන කඩදාසි (කොපි පොත් ආදිය ඇතුළුව) .. .. | 4.8 | 5.1 | 6.8 | 8.9 | 12.1 | 38.4 | 36.7 | 44.2 | 48.9 | 40.2 | 1.5 | 1.5 | 1.8 | 2.1 | 2.2 |
| මුද්‍රණ කඩදාසි .. .. | 4.5 | 5.9 | 4.2 | 3.1 | 3.9 | 36.0 | 42.4 | 27.3 | 17.0 | 13.0 | 1.4 | 1.8 | 1.1 | 0.7 | 0.7 |
| කාටන් හා අනෙකුත් අහුරන පෙට්ටි .. .. .. | 0.1 | 0.5 | 0.7 | 1.7 | 4.6 | 0.8 | 3.6 | 4.5 | 9.3 | 15.3 | ... | 0.2 | 0.2 | 0.4 | 0.9 |
| ඔතන කඩදාසි .. .. | 0.7 | 0.5 | 0.5 | 1.2 | 2.3 | 5.6 | 3.6 | 3.2 | 6.6 | 7.6 | 0.2 | 0.2 | 0.1 | 0.3 | 0.4 |
| අනෙකුත් .. .. .. | 2.4 | 1.9 | 3.2 | 3.3 | 7.7 | 19.2 | 13.7 | 20.8 | 18.1 | 23.9 | 0.8 | 0.6 | 0.8 | 0.8 | 1.3 |
| **XI. සකස්කළ නිෂ්පාදිත ..** | **7.4** | **9.1** | **11.2** | **15.1** | **38.5** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **2.4** | **2.7** | **2.9** | **3.5** | **7.2** |
| ඇලුමිනියම් භාණ්ඩ .. | 3.0 | 4.5 | 5.3 | 7.3 | 9.7 | 40.5 | 49.5 | 47.3 | 48.3 | 23.9 | 1.0 | 1.4 | 1.4 | 1.7 | 1.7 |
| ලෝහ භාජන .. .. | 1.4 | 1.5 | 2.7 | 2.1 | 4.9 | 18.9 | 16.5 | 24.1 | 13.9 | 12.7 | 0.4 | 0.5 | 0.7 | 0.5 | 0.9 |
| කටු කම්බි .. .. | 0.1 | 0.2 | 0.7 | 1.1 | 3.0 | 1.4 | 2.3 | 6.3 | 7.3 | 7.8 | ... | 0.1 | 0.2 | 0.3 | 0.6 |
| කම්බි ඇණ .. .. | 1.4 | 1.8 | 1.8 | 2.7 | 3.9 | 18.9 | 19.8 | 16.1 | 17.9 | 10.1 | 0.4 | 0.5 | 0.5 | 0.6 | 0.7 |
| අනෙකුත් .. .. .. | 1.5 | 1.1 | 0.7 | 1.9 | 17.5 | 20.3 | 12.1 | 6.3 | 12.6 | 45.5 | 0.5 | 0.3 | 0.2 | 0.4 | 3.3 |
| **XII. සකස් කළ නිෂ්පාදිත (අන් තැනක නොසඳහන්) ..** | **1.5** | **3.7** | **4.3** | **5.8** | **11.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **0.5** | **1.1** | **1.1** | **1.3** | **2.0** |
| ප්ලාස්ටික් .. .. .. | 0.7 | 2.0 | 2.5 | 3.1 | 5.8 | 46.7 | 54.1 | 58.1 | 53.4 | 52.7 | 0.2 | 0.6 | 0.6 | 0.7 | 1.1 |
| අනෙකුත් .. .. .. | 0.9 | 1.5 | 1.8 | 2.7 | 5.2 | 60.0 | 40.5 | 41.9 | 46.6 | 47.3 | 0.3 | 0.5 | 0.5 | 0.6 | 1.0 |
| **XIII. පිගන් බඩු .. ..** | **1.0** | **1.1** | **1.9** | **2.5** | **2.4** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **0.3** | **0.3** | **0.5** | **0.6** | **0.4** |
| **XIV. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) .. ..** | **6.8** | **8.3** | **10.9** | **13.7** | **17.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **2.2** | **2.5** | **2.8** | **3.2** | **3.2** |
| ටයර් නැවත පිරවීම .. .. | 4.4 | 5.3 | 6.8 | 9.1 | 11.0 | 64.7 | 63.9 | 62.4 | 66.4 | 64.7 | 1.4 | 1.6 | 1.8 | 2.1 | 2.0 |
| සයිකල් ටයර් හා ටියුබ් .. | 1.2 | 1.7 | 2.6 | 2.7 | 4.2 | 17.6 | 20.5 | 23.9 | 19.7 | 24.7 | 0.4 | 0.5 | 0.7 | 0.6 | 0.8 |
| අනෙකුත් .. .. .. | 1.2 | 1.3 | 1.5 | 2.0 | 1.8 | 17.6 | 15.7 | 13.8 | 14.6 | 10.6 | 0.4 | 0.4 | 0.4 | 0.5 | 0.3 |
| **XV. තුනී ලෑලි .. .. ..** | **2.3** | **2.9** | **3.4** | **3.9** | **3.9** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **0.7** | **0.9** | **0.9** | **0.9** | **0.7** |
| **XVI. ඛණිජ වැලි .. ..** | **—** | **0.1** | **0.1** | **0.1** | **0.9** | **—** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **—** | **...** | **...** | **...** | **0.2** |
| **XVII. මූලික කර්මාන්ත රසායන ද්‍රව්‍ය .. .. ..** | **—** | **0.2** | **1.1** | **1.2** | **1.0** | **—** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **—** | **0.1** | **0.3** | **0.3** | **0.2** |
| **XVIII. සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදිත .. ..** | **19.6** | **17.9** | **20.2** | **22.5** | **23.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **6.3** | **5.4** | **5.2** | **5.2** | **4.3** |
| එකතුව (I–XVIII) .. .. | **313.4** | **331.7** | **388.0** | **432.0** | **538.2** | | | | | | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |

කල දවස් ගණන අනුව, රැකියා පරිමාව 1964 දී අඩුවිය. රැකියා ප්‍රමාණය හැම කර්මාන්තයකට වඩා අඩු මට්ටමේ වූයේ මේ කර්මාන්තයේය. මෙයට හේතු වූ කරුණු දෙකකි. පළමු වැන්න, 1964 දී මෙම කර්මාන්තයට නව කර්මාන්තායතන බොහොමයක්ම ඇතුළු වූවද ඒවායේ වැඩ කෙරුනේ කොටසකදී පමණෙකි. දෙවැන්න, මෙම කර්මාන්තයෙහි දිගටම වැඩෙහි නියුතු නොවන කුඩා කර්මාන්තායතන බොහෝ ගණනක් තිබීමය.

III වැනි සංඛ්‍යා සටහනින් දැක්වෙන පරිදි, ප්‍රධාන ආර්ථික ගණ අනුව කාර්මික නිෂ්පාදනය වර්ග කරන කල, පාරිභෝගික භාණ්ඩ, ආයෝජන භාණ්ඩ හා අන්තර් භාණ්ඩ සඳහා වූ බරතැබීම් 1963 දීට වඩා වෙනස් වූයේ ඉතා සුළු වශයෙනි. පාරිභෝගික භාණ්ඩ අනුපාතය නොවෙනස්වම වගේ (කාර්මික නිපැයුමෙහි මුළු වටිනාකමෙන් සියයට 63 ක් ඇතුලත්ව) පැවති අතර අන්තර් භාණ්ඩ ගණය සුළු වශයෙන් අඩුවී ආයෝජන භාණ්ඩ ගණය පැත්තට නැඹුරු විය.

නිෂ්පාදිත පාරිභෝගික භාණ්ඩ අතුරින් පාවහන්, සම් භාණ්ඩ, විස්කෝතු හා රසකැවිලි නිෂ්පාදනය නොවැඩී විය. වැඩිවූයේ නම් ඉතා සුළුවශයෙනි. වෙළඳ පොළ සීමාසහිත වීම මෙම කර්මාන්තවල වර්ධනය සීමාකළා විය හැකිය. රසකැවිලි කර්මාන්තයෙහි නිෂ්පාදන පිළිවෙලේ පැහැදිලි වෙනසක් දැක්ක හැකිය. මෙහි සීනිබෝල නිෂ්පාදනය අඩුවී ඇති අතර චොක්ලට් හා ටොපි නිෂ්පාදනය වැඩිවී ඇත. මෙම පළමු කී සීනිබෝල සෑදීම සඳහා මුළුමනින්ම පිටරටින් ගෙන්වන ද්‍රව්‍ය යොදගත් අතර ටොපි හා චොක්ලට් සඳහා සියයට 50ක් පමණ මෙරට භාණ්ඩ (ප්‍රධාන වශයෙන්ම කොකෝවා) උපයෝගී කරගනු ලැබේ.

තවත් කර්මාන්ත සමහරක, එනම්; දුම්කොළ, ඇඳුම්, විවිධ රසායනික නිෂ්පාදිත, කඩදසි භාණ්ඩ හා කඩදසි බෝඩ් සහ වෙනත් තැනක නොසඳහන් නිෂ්පාදිත භාණ්ඩ වටිනාකමෙහි වැඩිවීමක් දක්නට ලැබිණ. මෙම වැඩිවීමෙන් වැඩි කොටසක්, ඒ ඒ නිෂ්පාදිත අතර බෙදී ගියේය. මේ නිෂ්පාදිත වලට, සත්වාහාර, පොල් තෙල්, දුම්කොළ, ඇඳුම්, සබන්, ප්ලාස්ටික් භාණ්ඩ, කෘමි නාශක ද්‍රව්‍ය, පොලිස් වගී සායම් හා වානිෂ්, හඳුන්කූරු, කපුරු, දත් බෙහෙත්, ලියන කඩදසි හා කොපි පොත්ද වෙයි.

ඇඳුම් කර්මාන්තය හා කඩදසි භාණ්ඩ හා කඩදසි බෝඩ් කර්මාන්තයෙහි ඇතිවූ මූර්ත වටිනා කමට වැඩි වටිනාකමක් නිෂ්පාදනයේ වාර්ෂික සංඛ්‍යා වලින් පිළිබිඹු වෙයි. ඉහත සඳහන් පරිදි සංඛ්‍යා සටහනේ දැක්වෙන ඇඳුම් නිෂ්පාදනයෙහි වැයවූ වටිනාකමින් කොටසක් සඳහා හේතුවූයේ, ප්‍රථම වර්ෂවලදී ඇතුලත් නොකල ව්‍යාවසායන් කීපයක් ඊට ඇතුලත් කිරීමය. කඩදසි හා කඩදසි නිෂ්පාදිත වටිනාකමෙහි වැඩිවීම අධික වශයෙන් දැක්වෙනුයේ, එම නිෂ්පාදිත වල වටිනාකම ද්විත්ව ගුණනය වීමය. එසේ වූයේ නැගෙනහිර කඩදසි සංයුක්ත මණ්ඩලයේ නිපදවනු ලබන ලියන කඩදසි, කාටන් කඩදසි හා ක්‍රාප්ට් කඩදසි, අනෙකුත් කර්මාන්තයතන විසින් ගෙන, කොපිපොත්, කවර, ලිපිගොනු කවර හා කඩදසි පෙ ිට් වැනි ද සෑදීම සඳහා යොදගෙන තිබීමේ හේතුවෙනි.

1960 හා 1963 අතර කාලය තුළදී ක්‍රමයෙන් ව්‍යාප්ත වී ගිය ලෝහ නිෂ්පාදිත කර්මාන්තය 1964දී අසමාන්‍ය වේගයකින් දියුණු විය. 1963 දී මෙම කර්මාන්තයේ නිෂ්පාදනවල වටිනාකම රුපි. කෝටි 1·51ක් වූ අතර, 1964 දී රුපියල් කෝටි 3·85ක් විය. මේ ශීඝ්‍ර වර්ධනයේ, විශාල කොටසකට හේතුවූයේ, පාරිභෝජන හා අන්තර් භාණ්ඩ වන ඇළුමිනියම් හා ලෝහ භාජන නිෂ්පාදනයට වඩා ආයෝජන භාණ්ඩ එනම්: වැට කම්බි, කටුකම්බි, යකඩ ඇන හා ගැල්වනයිස් නිෂ්පාදිතවල ඇතිවූ වර්ධනයයි. වැටකම්බි, කටුකම්බි හා ලෝහ භාජන නිෂ්පාදනය සැලකිය යුතු අන්දමින් වැඩිවීමත් සමග, එකී භාණ්ඩ ආනයනය 1964 දී රුපියල් කෝටි 0·25කින් අඩුවිය.

සංඛ්‍යා සටහන II (එ) අ. 3

## 1960-64 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම - ප්‍රධාන ආර්ථික ගණ අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1960 | 1961 | 1962 | 1963 | 1964 |
| **අ. පාරිභෝගික භාණ්ඩ** | **170·3** | **186·6** | **236·1** | **275·1** | **340·8** | **54·3** | **56·3** | **60·8** | **63·7** | **63·3** |
| ආහාර පාන හා දුම්කොළ | 87·8 | 94·8 | 105·0 | 119·1 | 133·7 | 28·0 | 28·6 | 27·1 | 27·6 | 24·8 |
| විවිධ ආහාර නිෂ්පාදන (1) | 33·6 | 35·8 | 33·6 | 34·1 | 36·0 | 10·7 | 10·8 | 8·7 | 7·9 | 6·7 |
| කල්තබාගත් හා ටින්වල අසුරන ලද පළතුරු හා එළවළු (2) | 1·3 | 1·6 | 2·3 | 3·4 | 4·5 | 0·4 | 0·5 | 0·6 | 0·8 | 0·8 |
| විස්කෝතු හා රසකැවිලි | 11·5 | 18·2 | 21·9 | 28·8 | 30·9 | 3·7 | 5·5 | 5·6 | 6·7 | 5·7 |
| සිසිල් බීම | 8·3 | 7·8 | 10·0 | 11·4 | 13·4 | 2·6 | 2·4 | 2·6 | 2·6 | 2·5 |
| බීර සහ ස්ටවුට් | 3·1 | 2·4 | 2·2 | 2·4 | 2·7 | 1·0 | 0·7 | 0·6 | 0·6 | 0·5 |
| දුම්කොළ | 30·0 | 29·0 | 35·0 | 39·0 | 46·2 | 9·6 | 8·7 | 9·0 | 9·0 | 8·6 |
| ඇඳුම් (3) | 19·4 | 19·8 | 29·3 | 38·4 | 54·9 | 6·2 | 6·0 | 7·5 | 8·9 | 10·2 |
| පාවහන් හා හම් නිෂ්පාදිත | 8·3 | 8·5 | 19·6 | 22·3 | 23·4 | 2·6 | 2·6 | 5·0 | 5·2 | 4·3 |
| විවිධ රසායනික නිෂ්පාදිත (4) | 36·4 | 40·3 | 51·5 | 56·0 | 73·7 | 11·6 | 12·1 | 13·3 | 13·0 | 13·7 |
| කඩදාසි හා කඩදාසි බෝඩ් භාණ්ඩ (5) | 7·2 | 7·0 | 10·0 | 12·2 | 19·2 | 2·3 | 2·1 | 2·6 | 2·8 | 3·6 |
| ලෝහ නිෂ්පාදිත (6) | 3·0 | 4·5 | 5·3 | 7·3 | 9·2 | 1·0 | 1·4 | 1·4 | 1·7 | 1·7 |
| සකස් කළ නිෂ්පාදිත (වෙන තැනක නොසඳහන්) (7) | 1·5 | 3·7 | 4·3 | 5·8 | 11·0 | 0·5 | 1·1 | 1·1 | 1·3 | 2·0 |
| පිහන් බඩු | 1·0 | 1·1 | 1·9 | 2·5 | 2·4 | 0·3 | 0·3 | 0·5 | 0·6 | 0·4 |
| රබර් භාණ්ඩ (8) | 5·7 | 6·9 | 9·2 | 11·5 | 13·3 | 1·8 | 2·1 | 2·4 | 2·7 | 2·5 |
| **ආ. අන්තර් භාණ්ඩ** | **119·4** | **122·7** | **126·9** | **126·8** | **146·3** | **38·0** | **37·0** | **32·7** | **29·3** | **27·2** |
| විවිධ ආහාර නිෂ්පාදන (9) | 110·4 | 111·1 | 114·2 | 113·5 | 124·7 | 35·2 | 33·5 | 29·4 | 26·2 | 23·2 |
| ලෝහ නිෂ්පාදන (10) | 1·4 | 1·5 | 2·7 | 2·1 | 4·9 | 0·4 | 0·4 | 0·7 | 0·5 | 0·9 |
| කඩදාසි හා කඩදාසි බෝඩ් භාණ්ඩ (11) | 5·3 | 6·9 | 5·4 | 6·0 | 10·9 | 1·7 | 2·1 | 1·4 | 1·4 | 2·0 |
| තුනී ලෑලි | 2·3 | 2·9 | 3·4 | 3·9 | 3·9 | 0·7 | 0·9 | 0·9 | 0·9 | 0·7 |
| ඛනිජ වැලි | — | 0·1 | 0·1 | 0·1 | 0·9 | — | ... | ... | ... | 0·2 |
| මූලික කාර්මික රසායන ද්‍රව්‍ය (12) | — | 0·2 | 1·1 | 1·2 | 1·0 | — | 0·1 | 0·3 | 0·3 | 0·2 |
| **ඇ. ආයෝජන භාණ්ඩ** | **23·7** | **22·4** | **25·1** | **30·4** | **51·1** | **7·7** | **6·7** | **6·5** | **7·0** | **9·5** |
| ලෝහ නිෂ්පාදන (13) | 3·0 | 3·1 | 3·2 | 5·7 | 24·4 | 1·0 | 0·9 | 0·8 | 1·3 | 4·5 |
| රබර් නිෂ්පාදන (14) | 1·1 | 1·4 | 1·7 | 2·2 | 3·7 | 0·4 | 0·4 | 0·4 | 0·5 | 0·7 |
| සිමෙන්ති හා සිමෙන්ති නිෂ්පාදිත | 19·6 | 17·9 | 20·2 | 22·5 | 23·0 | 6·3 | 5·4 | 5·2 | 5·2 | 4·3 |
| **එකතුව** | **313·4** | **331·7** | **388·0** | **432·0** | **538·2** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·C** |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුව

සංලක්ෂාය:

1. කිරි නිෂ්පාදිත (අයිස් ක්‍රීම් ඇතුළුව) ආහාරයට ගන්නා තෙල් සහ මේද යනාදිය
2. ජෑම්, ජෙලි, සෝස්, පළතුරු කෝඩියල් සනාදිය
3. කමිස සහ බැනියන් යනාදිය
4. ඖෂධ, විලේපන, සබන් හා පවිත්‍ර කිරීමේ සංයෝග, ගිණි පෙට්ටි, දන්තාලේප යනාදිය.
5. ලියන කඩදාසි, අභ්‍යාස පොත් ආදිය
6. ඇලුමිනියම් භාණ්ඩ
7. ප්ලාස්ටික් භාණ්ඩ යනාදිය
8. ටයර් නැවත පිරවීම, සයිකල් ටයර් හා ටියුබ්, සෙල්ලම් බඩු හා ගෘහෝපකරණ
9. ගව හා කුකුල් කෑම, තෙල් හා මේද, අයිස්, කපාපු පොල් යනාදිය
10. භාජන
11. මුද්‍රණ කඩදාසි, කාඩ්බෝඩ් හා අනෙකුත් අහුරන පෙට්ටි හා ඔතන කඩදාසි
12. කෝස්ටික් සෝඩා සහ ක්ලෝරයින්
13. කටුකම්බි, කම්බි ඇන, ගැල්වනයිස් නිෂ්පාදිත යනාදිය
14. ටයර් නැවත පිරවීම.

සංඛ්‍යා සටහන II (එ) අ. 4

## නිෂ්පාදන සමාගම් විශාලත්වය අනුව බෙදීගිය අයුරු - 1964 නිෂ්පාදන වටිනාකම පදනම් කොට ඇත.

| | | නිපැයුම් වටිනාකම | | | |
|---|---|---|---|---|---|
| | | රු. <250 දහස් | රු. 250 දහස් <2 දශ ලක්ෂ | රු. >2 දශ ලක්ෂ | එකතුව |
| I. විවිධ ආහාර නිෂ්පාදන | සමාගම් ගණන<br>නිපැයුමේ % | | | ලැබී නොමැත | |
| II. කල්තබාගත් හැ ටින්වල අසුරන ලද පළතුරු හා එළවළු | සමාගම් ගණන | 25 | 7 | — | 32 |
| | නිපැයුමේ % | 16·9 | 83·1 | — | 100.0 |
| III. විස්කෝතු හා රසකැවිලි | සමාගම් ගණන | 59 | 21 | 2 | 82 |
| | නිපැයුමේ % | 12·4 | 40·7 | 46·9 | 100.0 |
| IV. සිසිල් බීම | සමාගම් ගණන | 27 | 4 | 2 | 33 |
| | නිපැයුමේ % | 10·4 | 20·7 | 68·9 | 100.0 |
| V. බීර සහ ස්ටවුට් | සමාගම් ගණන | — | — | 1 | 1 |
| | නිපැයුමේ % | — | — | 100.0 | 100 0 |
| VI. දුම්කොළ | සමාගම් ගණන | 10 | 11 | 2 | 23 |
| | නිපැයුමේ % | 1·9 | 19·7 | 78·4 | 100.0 |
| VII. ඇඳුම් | සමාගම් ගණන | 73 | 23 | 7 | 103 |
| | නිපැයුමේ % | 9·9 | 29·3 | 60·8 | 100.0 |
| VIII. පාවහන් හා හම් නිෂ්පාදන | සමාගම් ගණන | 28 | 6 | 2 | 36 |
| | නිපැයුමේ % | 6·2 | 19·0 | 74·8 | 100.0 |
| IX. විවිධ රසායනික නිෂ්පාදිත | සමාගම් ගණන | 70 | 20 | 6 | 96 |
| | නිපැයුමේ % | 6·4 | 22·9 | 70·7 | 100.0 |
| X. කඩදසි හා කඩදසි බෝඩ් භාණ්ඩ | සමාගම් ගණන | 35 | 19 | 3 | 57 |
| | නිපැයුමේ % | 10·6 | 39·8 | 49·6 | 100.0 |
| XI. ලෝහ නිෂ්පාදිත | සමාගම් ගණන | 64 | 23 | 5 | 92 |
| | නිපැයුමේ % | 12·6 | 43·6 | 43·8 | 100.0 |
| XII. සකස්කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන්) | සමාගම් ගණන | 59 | 10 | — | 69 |
| | නිපැයුමේ % | 41·9 | 58·1 | — | 100.0 |
| XIII. පිඟන් බඩු | සමාගම් ගණන | — | — | 1 | 1 |
| | නිපැයුමේ % | — | — | 100.0 | 100.0 |
| XIV. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) | සමාගම් ගණන | 12 | 9 | 3 | 24 |
| | නිපැයුමේ % | 8·8 | 26·9 | 64·3 | 100.0 |
| XV. තුනී ලෑලි | සමාගම් ගණන | — | — | 1 | 1 |
| | නිපැයුමේ % | — | — | 100.0 | 100.0 |
| XVI. ඛනිජ වැලි | සමාගම් ගණන | — | 1 | — | 1 |
| | නිපැයුමේ % | — | 100 | — | 100.0 |
| XVII. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය | සමාගම් ගණන | — | 1 | — | 1 |
| | නිපැයුමේ % | — | 100 | — | 100.0 |
| XVIII. සිමෙන්ති හා සිමෙන්ති නිෂ්පාදිත | සමාගම් ගණන | 1 | — | 2 | 3 |
| | නිපැයුමේ % | 0·3 | — | 99·7 | 100.0 |
| **එකතුව** | සමාගම් ගණන | 463 | 155 | 37 | 655 |
| | නිපැයුමේ % | 8·7 | 28·4 | 62·9 | 100.0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුව

සංඛ්‍යා සටහන II (එ) අ. 5

## නිෂ්පාදන සමාගම් විශාලත්වය අනුව බෙදීගිය අයුරු - 1964
## වැටුප් ලැයිස්තු පදනම් කොට

| | | රු. < 15 දහස් | රු. 15 දහස් < 50 දහස් | රු. 50 දහස් < 500 දහස් | රු. > 500 දහස් | එකතුව |
|---|---|---|---|---|---|---|
| I. විවිධ ආහාර නිෂ්පාදිත .. .. | සමාගම් ගණන | | | | | |
| | වැටුපේ % | | ලබා ගැනීමට නොමැත | | | |
| II. කල් තබාගත් හා ටින්වල අහුරන ලද පළතුරු හා එළවළු .. .. | සමාගම් ගණන | 22 | 8 | 2 | — | 32 |
| | වැටුපේ % | 16·3 | 49·6 | 34·1 | — | 100·0 |
| III. බිස්කෝතු හා රසකැවිලි .. .. | සමාගම් ගණන | 52 | 21 | 8 | 1 | 82 |
| | වැටුපේ % | 10·8 | 21·6 | 28·8 | 38·8 | 100·0 |
| IV. සිසිල් බීම .. .. .. | සමාගම් ගණන | 22 | 5 | 5 | 1 | 33 |
| | වැටුපේ % | 4·0 | 3·5 | 37·7 | 54·8 | 100·0 |
| V. බීර සහ ස්ටවුට් .. .. | සමාගම් ගණන | — | — | 1 | — | 1 |
| | වැටුපේ % | — | — | 100·0 | — | 100·0 |
| VI. දුම්කොළ .. .. .. | සමාගම් ගණන | | | | | |
| | වැටුපේ % | | ලබා ගැනීමට නොමැත | | | |
| VII. ඇඳුම් .. .. .. .. | සමාගම් ගණන | 57 | 26 | 16 | 4 | 103 |
| | වැටුපේ % | 4·8 | 10·1 | 31·6 | 53·5 | 100·0 |
| VIII. පාවහන් හා නිෂ්පාදිත .. .. | සමාගම් ගණන | 23 | 5 | 5 | 2 | 35 |
| | වැටුපේ % | 2·6 | 3·7 | 17·4 | 76·3 | 100·0 |
| IX. විවිධ රසායනික නිෂ්පාදිත .. | සමාගම් ගණන | 55 | 22 | 17 | 2 | 96 |
| | වැටුපේ % | 4·3 | 9·5 | 38·0 | 48·2 | 100·0 |
| X. කඩදාසි හා කඩදාසි බෝඩ් වලින් තැනූ භාණ්ඩ .. .. .. | සමාගම් ගණන | 24 | 24 | 7 | 2 | 57 |
| | වැටුපේ % | 5·1 | 20·0 | 20·8 | 54·1 | 100·0 |
| XI. ලෝහ නිෂ්පාදිත .. .. | සමාගම් ගණන | 38 | 29 | 25 | — | 92 |
| | වැටුපේ % | 5·6 | 18·9 | 75·5 | — | 100·0 |
| XII. සකස් කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන්) .. | සමාගම් ගණන | 38 | 26 | 5 | — | 69 |
| | වැටුපේ % | 19·7 | 53·2 | 27·1 | — | 100·0 |
| XIII. පිහන් බඩු .. .. .. | සමාගම් ගණන | — | — | — | 1 | 1 |
| | වැටුපේ % | — | — | — | 100.0 | 100·0 |
| XIV. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) .. | සමාගම් ගණන | 5 | 9 | 10 | — | 24 |
| | වැටුපේ % | 1·6 | 12·5 | 85·9 | — | 100·0 |
| XV. තුනී ලෑලි .. .. .. | සමාගම් ගණන | — | — | — | 1 | 1 |
| | වැටුපේ % | — | — | — | 100.0 | 100·0 |
| XVI. බනිජ වැලි .. .. .. | සමාගම් ගණන | — | — | 1 | — | 1 |
| | වැටුපේ % | — | — | 100.0 | — | 100·0 |
| XVII. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය .. | සමාගම් ගණන | — | — | — | 1 | 1 |
| | වැටුපේ % | — | — | — | 100.0 | 100·0 |
| XVIII සිමෙන්ති හා සිමෙන්ති නිෂ්පාදිත .. | සමාගම් ගණන | 1 | — | — | 2 | 3 |
| | වැටුපේ % | 0·3 | — | — | 99·7 | 100·0 |
| එකතුව | සමාගම් ගණන | 337 | 175 | 102 | 17 | 631 |
| | වැටුපේ % | 4·3 | 11·0 | 34·9 | 49·8 | 100·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුව

ආනයන උපකරණ ලෝහ නිෂ්පාදිත කර්මාන්තයේ පදනම වෙයි. සාමාන්‍ය නිෂ්පාදන වියදමෙන් වැඩි කොටසක් මේ වෙනුවෙන් මිඩංගු වන නිසා මේ භාණ්ඩ ආනයන නොකිරීමෙන් ඉතිරිකර ගතහැකි විදේශීය විනිමය ප්‍රමාණය ඉතා සුළු වෙයි. 1964 දී මෙම කර්මාන්තයේ කර්මාන්තායතන 9ක් උපයෝගී කොට ගත් ආනයන කළ අමු ද්‍රව්‍ය වල වටිනාකම රුපියල් කෝටි 0·48ක් වූ අතර ඒවායේ මුළු වැටුප් වියදම රු.පි, 3,71,000ක් විය. එහෙත් මෙම භාණ්ඩ මෙරට නිපදවීම කරුණු දෙකක් නිසා ලාභ සහගතය. විශාල භාණ්ඩ (තෙල් ඇසිරීමට හා ගෙනයාමට ගන්නා ලෝහ භාජන හා ලොකු ඇළුමිණියම් භාජන) හා සම්බන්ධයෙන් කිව හැක්කේ ලෝහ තහඩු වශයෙන් ගෙන්වා සෑදීමෙන් නැව් කුලී ඉතිරි කරගත හැකිය. අනෙකුත් නිෂ්පාදිත (කටු කම්බි, කම්බි ඇණ, කම්බි කොකු හා රේසර් තල) සම්බන්ධයෙන් කිවහැක්කේ ආනයන අඩුවීම නිසා මෙරට වෙළඳ පොලේ මිල වැඩිවීමෙන් ආනයන සීමාකිරීම්වලට අනතුරුව ඉන් ලාබයක් ලැබීමට හැකිය. ලෝහ භාජන නිෂ්පාදනය සැලකියයුතු ලෙස වැඩිවී ඇති නමුදු ආලේප වර්ග, රස කැවිලි හා කල් තබන පළතුරු අසුරා විකිණීම සඳහා කර්මාන්තායතන ගන්නා භාජන වල ප්‍රමාණය හා හැඩය ඒකාකාර නොවීමේ හේතුවෙන් මෙරට නිෂ්පාදිත යෙන් ලැබිය හැකි පරිමාණ පිරිමැසුම් සීමාවී ඇත.

# (එ) (ආ) 1964 රාජ්‍යාංශයේ කර්මාන්ත

1962/64 කාලඡේදය තුළ සමායතන වල නිපැයුම මෙහි එන II (එ) ආ 1 සංඛ්‍යා සටහනින් දැක්වේ.

සංඛ්‍යා සටහන II (එ) ආ 1

**රජයේ කර්මාන්ත සමායතන 10 ක නිපැයුම 1962 - 1964**

| සමායතනයේ නම | නිපැයුම් ඒකකය | 1962 නිපැයුම | 1963 නිපැයුම | 1964 නිපැයුම |
|---|---|---|---|---|
| ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය .. | ටොන් | 85,700 | 76,764 | 79,508 |
| ජාතික රෙදිපිළි සංස්ථාව .. .. | කපු නූල් රාත්තල් | 11,46,745 | 19,56,976 | 21,84,559 |
| ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය .. | ටොන් | 1,044 | 1,467 | 1,958 |
| නැගෙනහිර කඩදාසි කර්මාන්ත ශාලා සංයුක්ත මණ්ඩලය .. .. .. | ටොන් | 4,690 | 5,340 | 6,451 |
| පරන්තන්හි රසායන ද්‍රව්‍ය සාමායතනය .. | කෝස්ටික් සෝඩා ටොන් | 915 | 985 | 895 |
| | කෙලෝරින් ටොන් | 217 | 270 | 230 |
| ලංකා තෙල් හා මේද සංස්ථාව .. .. | පොල්තෙල් ටොන් | 13,163 | 9,467 | 1,961 |
| | පොල්වලින් සෑදූ කෑම ටොන් | 20,321 | 19,305 | 21,565 |
| | සත්ව හා කුකුල් ආහාර | | | |
| ලංකා පිඟන් බඩු සංස්ථාව .. .. | සෙරෙමික් භාණ්ඩ ටොන් | 687 | 770 | 888 |
| ලංකා ඛනිජ වැලි සමායතනය .. .. | ඉල්මනයිට් ටොන් | 3,383 | 5,020 | 45,503 |
| ලංකා සම් භාණ්ඩ සංයුක්ත මණ්ඩලය .. | ක්‍රෝම් වර්ග අඩි | 5,11,000 | 5,00,100 | 5,11,310 |
| | අනෙකුත් සම් නිෂ්පාදිත රාත්තල් | 1,99,000 | 2,15,400 | 2,16,900 |
| | සපත්තු ජෝඩු | 1,01,000 | 1,62,700 | 1,68,490 |
| ලංකා තුනී ලෑලි සංස්ථාව .. .. | වෙළුනේ තුනී ලෑලි වර්ග අඩි | 1,10,63,000 | 1,35,58,000 | 1,22,15,658 |

සංඛ්‍යා : ඒ ඒ සමායතනවලින් ලබාගන්නා ලදී.

රසායන ද්‍රව්‍ය තෙල් හා මේද සහ තුනී ලෑලි සංස්ථාවන් හැර අනෙකුත් සියලුම සංස්ථා 1963 දීට වඩා 1964 දී නිෂ්පාදනය කොට ඇති බව පෙනේ. මේ දියුණුවට හේතු වශයෙන්, පවත්නා නිෂ්පාදන ශක්තිය සම්පූර්ණ ලෙස උපයෝගී කර ගැනීම දක්විය හැකිය. තවමත් සංවර්ධනයෙහි මුල් අවස්ථාවෙහි පවත්නා කර්මාන්ත වලින් ද මෙයම බලාපොරොත්තු විය හැකිය. සීනි සංයුක්ත මංඩලයේ නිපැයුම වැඩිවීමට බෙහෙවින්ම හේතු වූයේ වගාකළ (උක්) බිම් ප්‍රමාණය වැඩි වීමය. කඩදාසි සංයුක්ත මණ්ඩලයේ නිපැයුම වැඩිවීම, ප්‍රධාන වශයෙන්ම, කාර්මික සැකසීම හා දැනට තිබෙන උපකරණ වල වැඩිදියුණු කිරීම් නිසා වුවකි. පිඟන් බඩු සංස්ථාවෙහි කම්කරුවන් ලබා ඇති පලපුරුද්ද හා නිපුනත්වය වැඩිවීම හේතු කොට, වැඩි වැඩියෙන් වඩා හොඳ භාණ්ඩ නිපැයීමට එම සංස්ථාවට හැකි විය.

බොහෝ කර්මාන්ත වල නිෂ්පාදනය වැඩිවීමට පටන් ගෙන ඇතද, සවිකර ඇති යන්ත්‍රෝපකරන වල නිපැයුම් හැකියාවේ පමණට තවමත් නිපදවෙන්නේ නැත. මෙයට කදිම නිදසුනක් වශයෙන් සීනි සංයුක්ත මණ්ඩලය දක්විය හැකිය. එහි දැනට නිපැදවෙන ප්‍රමාණය කම්හලේ නිපැයුම් ශක්තියෙන් දහයෙන් එකක් පමණෙකි. පුහුණු සේවකයන් බඳවා ගැනීමේ හා උක් කැපීම සඳහා කම්කරුවන් සොයා ගැනීමේ ප්‍රශ්නය නිෂ්පාදනයේ වර්ධනය සඳහා පවත්නා සමහර බාධකයෝ වෙති. කම්කරු බලකායේ නිපැයුමද ඉතා මඳය. මෙය මිනිස් දවසකට, ටොන් 0·4 ක් පමණ වෙයි. ඕස්ට්‍රේලියාවේ මිනිස් දවසක නිපැයුම ටොන් 4 ක් වෙයි. තෙල් හා මේද සංයුක්ත මණ්ඩලයේද මෙවැනිම තත්ත්වයක්

ඇත. එහි තෙල් මෝලේ හා ආහාර නිෂ්පාදනාගාරයේ වැඩ කැරෙනුයේ මුළු නිපැයුම් ශක්තියෙන් සියයට 35 ක් හා සියයට 56 ක් පමණෙකි. මෙහි නිපැයුම් හැකියාවන් සීමාවීමට ප්‍රධාන සාධකයන් වී ඇත්තේ තෙල් මෝලේ අතුරු නිෂ්පාදන සඳහා, සෑහෙන විදේශීය වෙළෙඳ පොළවල් නොතිබීමත්, අඩු වියදමින් වැඩ කරන සුළු නිෂ්පාදකයන්ගෙන් ඇති වන දැඩි තරඟය නිසා සංයෝග කරන ලද කුකුල් ආහාර වලට ඇති ඉල්ලුම බොහෝ සෙයින් උච්චාවචනය වීමත්ය.

කඩදාසි කර්මාන්ත ශාලා, රසායන ද්‍රව්‍ය හා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩල ද වැඩට ගන්නේ ඒවායේ නිපැයුම් ශක්තියෙන් 3/4 ක් පමණකි. කඩදාසි සංයුක්ත මණ්ඩලයට මෙරට අමු ද්‍රව්‍ය ලබා ගැනීමට හෝ සේවකයන් ලබා ගැනීමට හෝ වැඩි අපහසුවක් නොමැති වුවද, කපන අස් වද්දන කාලයේදී සේවකයන් නොපැමිනීමේ ප්‍රශ්නයට මුහුණ පෑමට සිදු වෙයි. රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩල යට, කෙලෝරින් සඳහා සෑහෙන වෙළෙඳ පොළවල් සොයාගත නොහැකි වීම නිපැයුම් හැකියාවේ පමණට නිපැයුම දියුණු කිරීමට බාධාවක්ව පවතී. 1964 දී, ඇත්ත වශයෙන්ම, මෙහි නිපැයුම, පහළ වැටිණි. මෙයට බෙහෙවින්ම හේතු වූයේ එහි පැවැති වැඩ වර්ජන දෙකක් හා යන්ත්‍රෝපකරණ ක්‍රියා විරහිත වීමය. එවැනිම හේතුන් උඩ තුනී ලෑලි සංයුක්ත මණ්ඩලයේ නිපැයුම ද 1964 වසරේදී පහළ වැටිණි.

රාජ්‍යාංශයේ කර්මාන්ත වල නිපැයුම සාමාන්‍යයෙන් වැඩිවීම නිෂ්පාදන වියදම් සීමා කිරීමෙහි ලා බලපෑමක් ඇති කළේය. සමහර සංයුක්ත මණ්ඩලවල නිෂ්පාදනය වැඩිවීම නිසා ස්ථාවර වියදම් බෙදීයාමෙන්, ඒකකයක නිෂ්පාදන වියදම පහළ වැටිණි. තවත් සමහරක, ඒකකයක නිෂ්පාදන වියදම නොවෙනස්ව පැවතුන අතර, සමහරක මඳ වශයෙන් ඉහළ ගියේය. මෙයට හේතු වූයේ, වැටුප් වියදම් හා අමු ද්‍රව්‍ය මිල වැඩිවීමත්, නිෂ්පාදන පිරිවැටුම් බද්ද පැනවීමත් නිසා වැඩි වූ නිපැයුමෙන් ලද වාසිය මැකීයාමය.

සමායතන සිය භාණ්ඩ සඳහා 1964 දී අය කරන ලද්දේ 1963 දී අය කරන ලද මිල ගණන්මය. බොහෝ සමායතන වල භාණ්ඩ මිල කිරීමේ ප්‍රතිපත්තියෙහි වෙනස්කම් දක් නට ලැබේ. සිමෙන්ති, සීනි හා කඩදාසි, සමායතනයන්හි මිල නියම කිරීම සඳහා ඔවුන්ගේ නිෂ්පාදිත වල ආනයන මිලට තීරු බදු එකතු කොට පදනම වශයෙන් ගනී. තෙල් හා මේද සංයුක්ත මණ්ඩලයේ ආහාර නිෂ්පාදිත, සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ සම් නිෂ්පාදිත හා පිඟන් බඩු සහ තුනී ලෑලි සංස්ථාවල නිෂ්පාදිත මිල කැරෙනුයේ නිෂ්පාදන වියදමට ලාභාංශයක් එකතු කිරීමෙනි. අනෙකුත් බොහෝ සමායතන වල මෙන් නොව සම් භාණ්ඩ සමායතනයට දැඩි තරඟයකට මුහුණ පෑමට සිදුවී තිබෙන නිසා එහි සපත්තු මිල කැරෙනුයේ, තරඟ කළහැකි මිල මට්ටමකටය. එසේම, ඛනිජ වැලි සමායතනයේ නිෂ්පාදිත මුළු මනින්ම අපනයනය සඳහා වන බැවින් ඒවා මිල කැරෙනුයේ, ලෝක වෙළෙඳ පොළේ තරඟ මිල අනුවය.

1964 දී රාජ්‍යාංශයේ කර්මාන්ත වල නිපැයුම් ප්‍රමාණය වඩා හොඳ වූ බව ඒවායේ මුදල් තත්ත්වය දියුණු වීමෙන් පිළිඹිඹු වෙයි. එකක් හැර, අනික් සියලුම සමායතන 1963 වසරේදීට වඩා 1964 දී වැඩි ලාභයක් (හෝ සුළු අලාභයක්) ලැබූ බව පහත එන සංඛ්‍යා සටහනින් දැක්වේ.

සංඛ්‍යා සටහන II (එ) අං 2

**1963 හා 1964 දී රජයේ සමායතන දෙළහක් ඉපැයූ ලාභ**

**(අවක්‍ෂ බදු ගෙවීමට ප්‍රථම)**

| සමායතනයේ නම | 1963 ලාභය/පාඩුව රු. | 1964 ලාභය/පාඩුව රු. | 1964 ආයෝජිත ප්‍රාග්ධනය රු. | 1964ලැබූලාභය ආයෝජිත ප්‍රාග්ධනයෙහි සියයට ගණනක් වශයෙන් |
|---|---|---|---|---|
| ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය .. | ලාභ 60,45,418 | ලාභ 61,36,198 | 8,10,50,893 | 7·57 |
| ජාතික රෙදිපිළි සංස්ථාව .. .. | ල. නො. | ලාභ 11,50 000 | 4,40,00,000 | 2·61 |
| ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය .. | පාඩු 34,00,000 | ලාභ 5,00,000 | 3,50,00,000 | 1·43 |
| නැගෙනහිර කඩදාසි කර්මාන්ත ශාලා සංයුක්ත මණ්ඩලය .. .. | ලාභ 82,068 | පාඩු 3,71,156 | 2.72,00,000 | |
| ජාතික සුළු කර්මාන්ත සමායතනය .. | පාඩු 7,00,000 | පාඩු 6,90,000 | 1,19,98,685 | |
| පරන්තන්හි රසායන ද්‍රව්‍ය සමායතනය | පාඩු 7,79,536 | පාඩු 7,30,000 | 1,05,00,000 | |
| ලංකා තෙල් හා මේද සංස්ථාව .. | ල. නො. | පාඩු 3,50,000 | 90,58,575 | |
| ලංකා පිඟන් බඩු සංස්ථාව .. | ලාභ 3,51,000 | ලාභ 5,07,892 | 90,00,000 | 5·64 |
| ලංකා ඛනිජ වැලි සමායතනය .. | පාඩු 6,25,778 | ලාභ 1,03,000 | 80,96,039 | 1·27 |
| ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය .. | ලාභ 4,43,124 | ලාභ 4,78,100 | 66,63,998 | 7·17 |
| කාර්මික ජනපද සංයුක්ත මණ්ඩලය . | ල. නො | පාඩු 6,373 | 55,22,144 | |
| ලංකා තුනී ලෑලි සංස්ථාව .. .. | ලාභ 1,39,326 | ලාභ 2,67,800 | 52,04,581 | 5·14 |
| එකතුව | ලාභ 15,55,622 | ලාභ 69,95,461 | 25,32,94,915 | 2·76 |

සංඛ්‍යා:– ඒ ඒ සමායතනවලින් ලබාගත් සංඛ්‍යා තොරතුරු, මෙම සංඛ්‍යා තාවකාලිකය. එසේම විගණනයට යටත් වෙයි.

ල. නො:– ලබා ගැනීමට නොමැත.

2 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇති සමායතන 12න් හතකින් ම ලාභයක් හෝ අතිරික්තයක් ලැබෙයි. මෙයින් හතරක අතිරික්තය යෙදූ වූ ප්‍රාග්ධනයෙන් සියයට 5 ටත්වඩා වැඩිය. සමායතන දෙළසේ සාමාන්‍ය ලාභ අනුපාතිකය යෙදූ වූ ප්‍රාග්ධනයෙන් සියයට 2·76 කැයි ගණන් බලා ඇත. සමායතන වල මූල්‍ය ප්‍රතිඵල යහපත් වීම දිරිගන්වන සුළුය. රාජ්‍යාංශයේ කර්මාන්ත වලට තවත් මුදල් යෙදවීම හා වැඩිදියුණු කිරීම සඳහා අතිරික්තයක් තිබීම වැදගත් වෙයි. මෙම අතිරික්තයන් වැඩි කර ගැනුමට ඇති හොඳ ම ක්‍රමය නම් නිෂ්පාදන ශක්තියේ මට්ටමට කිට්ටු වන සේ නිපැයුම වැඩි කිරීමයි. එවිට ඒකකයක නිෂ්පාදන වියදම් පහළ වැටී නිපැයුම වැඩිවීමත් සමග ලාභය වැඩි වන්නේය. බොහෝ තන්හි වැඩි නිපැයුම් සඳහා සෑහෙන ඉල්ලුමක් ඇති බව පෙනේ.

**අළුත් කාර්මික යෝජනා ක්‍රම.**

රජයේ අළුත් කාර්මික යෝජනා ක්‍රම කීපයකම වැඩ දැනට නිමාවෙමින් පවතී. වානේ සංයුක්ත මණ්ඩලයේ හා වානේ පදම් කරන මෝල හා කම්බි මෝල ඉදිකිරීමේ කටයුතු වර්ෂය තුළ කෙරීගෙන ගිය අතර, 1966 වසරේ මුල් හරියේදී නිමාවනු ඇත. ටයර් සංස්ථාවේ වැඩ හා කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ කටයුතු නියමිත පරිදි කෙරීගෙන යයි. නිෂ්පාදනය 1965 දී අරඹා වසරකට ටයර් 2,50,000 ක් නිපදවීමට බලාපොරොත්තු වෙයි. යකඩ භාණ්ඩ හාඩ්බෝර්ඩ් හා පිටි කම්හල් සඳහා බිම් සකස් කිරීම හා කම්හල් තැනීමේ මූලික කටයුතු අරඹා ඇත.